# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2127/23 – 2019 ජුනි 13 වැනි බ්‍රහස්පතින්දා – 2019.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 1868/51 හා 2014.06.25 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද්දා වූ ද, 2014 අංක 145 හා 2014.06.23 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එබැවින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1868/51 හා 2014.06.25 වැනි දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 2014 අංක 145 හා 2014.06.23 වැනි දින දරන ආඥාව මෙම ආඥාව මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2011/WS/328.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: දො/ඉ/1/අත්/104.
2019 මැයි මස 29 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැබඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේජ්/ඩීඩීඑන්/12/55 හා 2012.09.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.3224ක් පමණ වන වෝගන්වත්ත දීගල්ල කොටස නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

2. **පරවශ්‍යතාවේ විස්තරය.**– අළුත්ගම, මතුගම, අගලවත්ත, ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමයේ සනමීටර් 600 නැබඩ ජල කුළුණ හා වැඩභාර නිලධාරි කාර්යාල ඉඩමට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශතාවය අත්කර ගැනීම:

01. **කැබලි අක්ෂර 'ඒ' – වෝගන්වත්ත-දීගල්ල කොටස – ප්‍රමාණය: හෙක්. 0.3224ක් පමණ**

උතුරට, නැගෙනහිරට සහ දකුණට: කොටගල වැව්ලි සමාගම හිමිකම් කියන වෝගන්වත්ත-දීගල්ල කොටස; බටහිරට: මාර්ගය සහ කොටගල වැව්ලි සමාගම හිමිකම් කියන වෝගන්වත්ත-දීගල්ල කොටස.

06 – 806